**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

# වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය (TNSWSP)**

# අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ආරාධනයයි (EOI)

## නීති සහ නියාමන කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ නිලධාරී තනතුරෙහි රාජකාරි ඉටුකිරීම සඳහා (තනි පුද්ගල) කාර්යය පැවරීම

1) ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ කටයුතු පහසු කිරීමේ ගිවිසුම (WTO-TFA) සඳහා අත්සන් තබා ඇති පාර්ශවකරුවෙකු ලෙස, දේශසීමා හරහා රටවල් අතර සිදුකරන වෙළඳ කටයුතුවල (ආනයන, අපනයන හා ප්‍රතිනැව්ගත කිරීම්) නිරත වෙළඳුන් විසින් දේශසීමා ආශ්‍රිත වෙළඳ නියාමන නියෝජිතායතන වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය සියලු ලේඛන සහ දත්ත ස්වයංක්‍රීය පද්ධතියක් ඔස්සේ ඉදිරිපත් කිරීම සඳහා සහ කාලානුරූපී ආකාරයෙන් එවැනි ක්‍රියාවලීන්ගේ ප්‍රතිඵල ද වෙළඳුන් වෙත දැන්වීම සඳහා එක් ස්ථානයක් (single-entry point) වශයෙන් වෙළඳ ජාතික තනි කවුළු පද්ධතියක් ශ්‍රී ලංකාව විසින් ස්ථාපනය කිරීම අවශ්‍ය වේ. ඒ අනුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් යෝජිත වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, එකී කාර්යය උදෙසාම වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් (PIU) හරහා ආරම්භ කර තිබේ.

2) එනිසා, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ නීති සහ නියාමන කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ නිලධාරී තනතුරෙහි රාජකාරි මාස 24ක කාලසීමාවක් සඳහා කාර්ය පැවරුම් පදනමින් ඉටුකිරීම සඳහා රාජ්‍ය අංශයේ හෝ පුද්ගලික අංශයේ වඩාත්ම සුදුසුකම් සපුරා ඇති පුද්ගලයන් වෙතින් අභිලාෂය ප්‍රකාශ කිරීම් කැඳවීම සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් තීරණය කර තිබේ.

3) මේ සඳහා උනන්දුවක් දක්වන තැනැත්තන්ට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් "ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ නීති සහ නියාමන කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ නිලධාරී තනතුරෙහි රාජකාරි ඉටුකිරීමේ කාර්යය පැවරීම සඳහා අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ආරාධනය යි" මැයෙන් වූ ලේඛනය ලබාගැනීම සඳහා මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

4) මෙම කාර්යය පැවරුම සඳහා අයදුම්කිරීමට උනන්දුවක් දක්වන තැනැත්තන් විසින් මාස 24 ක කාල සීමාවක් සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ නීති සහ නියාමන කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ නිලධාරී තනතුරෙහි රාජකාරි ඉටුකිරීම සඳහා **යොමුකිරීමේ අනුදේශවල** (Terms of Reference -TOR) විස්තර කර ඇති පරිදි සතුටුදායක අන්දමින් අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

5) යොමු කිරීමේ අනුදේශවල (TOR) නිශ්චිතව දක්වා ඇති සියලු සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කරන සහතික කළ පිටපත් සමඟින් ඒ සම්බන්ධයෙන් පූර්ව හා වර්තමාන සේවාදායකයන් ඔස්සේ සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කිරීම සඳහා වන ලේඛනමය සාක්ෂි ද සමඟින් යොමු කිරීමේ අනුදේශවල නිශ්චිතව දක්වා ඇති කාල රාමුව ඇතුළුව අපේක්ෂිත රාජකාරි සහ වගකීම් සමඟ අනුකූල සවිස්තරාත්මක යෝජනාව සහ කාර්ය සැලැස්ම සහිතව ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි **"ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ නීති සහ නියාමන කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ නිලධාරී තනතුරෙහි රාජකාරි ඉටුකිරීමේ කාර්යය පැවරීම සඳහා අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ආරාධනයයි"** මැයෙන් සඳහන් කරනු ලැබූ අභිලාෂය ප්‍රකාශ කිරීමේ ලේඛන ලියාපදිංචි තැපැල/ අතින් භාරදීම ඔස්සේ පමණක් 2025.07.12 වැනි දින හෝ ඊට පෙර පහත ලිපිනය වෙත යොමු කළ යුතු ය. ඉහත සඳහන් කරන ලද තාක්ෂණික යෝජනා සහ මූල්‍ය යෝජනා වෙන වෙනම ලියුම් කවර දෙකක ( 02 ) බහා ඉදිරිපත් කිරීම අවශ්‍ය බව කාරුණිකව දන්වමි.

6) මෙම කාර්යය පැවරුම සඳහා වන යොමු කිරීම් අනුදේශවල නිශ්චිතව දක්වා ඇති අවශ්‍ය අවම සුදුසුකම් සහිත කෙටි ලැයිස්තු ගතකරනු ලබන අයදුම්කරුවන් මූලික සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව මෙම කාර්යය පැවරුම සඳහා වඩාත් යෝග්‍ය අයදුම්කරු තෝරාගනු ලැබේ. සුදුසුකම් සහ පිරිවැය යන කරුණු දෙකම අවසාන තෝරාගැනීමේදී සැලකිල්ලට ගනු ලැබේ.

7) මෙහි සඳහන් හෝ සඳහන් නොවන යම් කරුණක් සම්බන්ධයෙන් හෝ තෝරා ගැනීමේ ක්‍රියාවලිය තුළ පැන නගින යම් ගැටලුවක් සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් හා එකම තීරණය වේ.

8) අවශ්‍ය ලේඛන (යොමු කිරීමේ අනුදේශ, අභිලාෂය ප්‍රකාශය කිරීම් ආදිය) සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

**ලේකම්,**
**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,**
**මහලේකම් කාර්යාලය, කොළඹ 01.**

**දිනය: 2025.06.29**